Government of Western Australia
North Metropolitan Health Service

BreastScreen WA
WA's only accredited screening service

# ඔබගේ මැමොග්‍රෑම් පරීක්ෂාවට පසු, කුමක් සිදුවේද?

## මෙම වැදගත් සෞඛ්‍යය පරීක්ෂාව කර ගැනීම සම්බන්ධයෙන් ඔබට ශුභ පැතුම්!

ඔබගෙන් ලබාගත් ඡායාරූප විකිරණවේදීන් දෙදෙනෙකු විසින් කියවනු ඇත. සති දෙකක් ඇතුලත ඔබගේ ප්‍රතිඵල තැපැල් කරන බවට හෝ ඉලෙක්ට්‍රොනිකව යවන බවට වගබලා ගැනීමට සෑම උත්සාහයක්ම දරණු ඇත. ඔබ වෙනත් ආකාරයකට ඉල්ලා නොමැති අවස්ථාවක ඔබ විසින් නම්කල වෛද්‍යවරයා හටද පිටපතක් යවනු ඇත. ඔබගේ කැමැත්ත ඇතිව ඔබගේ මැමොග්‍රෑම් පරීක්ෂණ ප්‍රතිඵල ඔබගේ මයි හෙල්ත් රෙකෝඩ් හිද ඇතුලත් කරනු ඇත. ඔබට කිසියම් ගැටළුවක් ඇතිනම්, අපගේ වෙබ් අඩවිය වන www.breastscreen.health.wa.gov.au වෙත පිවිසිය හැකිය, නැතිනම් දුරකථන අංක (08) 9323 6700 හෝ දුර බැහැර පළාත් සඳහාවූ නොමිළේ දුරකථන අංක 1800 800 033 ඇමතිය හැකිය.

## මා විසින් නැවත එක්ස් රේ පරීක්ෂාවක් කරගත යුතුනම් කුමක් සිදුවේද?

ලබාගත් ඡායාරූපය පැහැදිලි නොමැතිනම්, ඉතා කලාතුරකින් විකිරණවේදී විසින් ඔබ හට නැවත එක්ස් රේ ඡායාරූපයක් ලබා ගන්නා ලෙස ඉල්ලා සිටිය හැකිය. මෙය අවශ්‍යනම්, ඔබ හට ලිපියක් හෝ දුරකථන ඇමතුමක් ලැබෙන අතර ඔබට නැවත එන ලෙස දැනුම් දෙනු ඇත. මෙම නැවත ගනු ලබන එක්ස් රේ ඡායාරූප ගනු ලබන්නේ පරීක්ෂා කරන සායනය තුලදීය.

## මා විසින් තවදුරටත් එක්ස් රේ ඡායාරූප ගැනීම අවශ්‍යනම් කුමක් සිදුවේද?

කාන්තාවන් 20 දෙනෙකුගෙන් 1 අයෙකුට පමණ තවදුරටත් ගනු ලබන එක්ස් රේ ඡායාරූප සඳහා නැවත පැමිණෙන ලෙස ඉල්ලා සිටිනු ඇත. මෙම එක්ස් රේ ඡායාරූප මගින් අවධානය යොමු කරන්නේ සවිස්තරාත්මකව බැලිය යුතු පියයුරු කොටස් සම්බන්ධයෙනි. මෙසේ කිරීමට අවශ්‍යනම්, BreastScreen WA මගින් ඔබ හා සම්බන්ධවී හමුවීමක් පිළියෙල කරනු ඇත.

## මෙට්‍රොපොලිටන් ප්‍රදේශවල ජීවත්වන කාන්තාවන්

මෙට්‍රොපොලිටන් ප්‍රදේශවල වැඩිදුර එක්ස් රේ ඡායාරූප ගැනීම සිදුකරන්නේ, ෆියෝනා ස්ටැන්ලි, රෝයල් පර්ත් සහ සර් චාර්ල්ස් ගෙයාර්ඩිනර් යන රෝහල්වල පිහිටා ඇති BreastScreen WA පියයුරු ඇගයීම් මධ්‍යස්ථානවලින් එකකදීය. බොහෝ අවස්ථාවල මෙම වැඩිදුර එක්ස් රේ ඡායාරූප මගින් කිසිදු ගැටළුවක් නැති බව පෙන්වයි. කාන්තාවන්ගෙන් කුඩා ප්‍රමාණයක් සඳහා අල්ට්‍රාසවුන්ඩ් සහ බයොප්සි ආදී වැඩිදුර පරීක්ෂණ සිදු කිරීම අවශ්‍ය වනු ඇත. මෙම පරීක්ෂණ සිදු කරන්නේ වැඩිදුර එක්ස් රේ ඡායාරූප ගන්නා දිනයේදීමය.

## දුර බැහැර වෙස්ටර්න් ඕස්ට්‍රේලියා ප්‍රදේශවල ජීවත්වන කාන්තාවන්

දුරබැහැර ප්‍රදේශවල ජීවත්වන කාන්තාවන් සඳහා වැඩිදුර එක්ස් රේ පරීක්ෂා සිදු කරන්නේ ජංගම සේවා තුලදීය. අමතර පරීක්ෂා අවශ්‍යනම් BreastScreen WA ඔබ හා සම්බන්ධවී ඒ බව ඔබට දැනුම් දෙනු ඇත. බන්බරි සවුත් වෙස්ට් හෙල්ත් කැම්පස් හි ස්ථිර ප්‍රාදේශීය පරීක්ෂණ සහ ඇගයීමේ මධ්‍යස්ථානයක් ඇත.

## වැඩිදුර පරීක්ෂණ සිදු කරන බොහෝ කාන්තාවන් හට පියයුරු පිළිකා නැති බවට මතක තබා ගැනීම ඉතා වැදගත්වේ

වැඩිදුර පරීක්ෂණ අවශ්‍ය සියළුම කාන්තාවන් හට ඍජුවම අපගේ පියයුරු ඇගයීමේ මධ්‍යස්ථානවලින් එකකට හෝ සිය වෛද්‍යවරයා වෙත යොමු කර ගැනීමේ හැකියාව ඇත. සියළු පරීක්ෂණ ප්‍රතිඵල, හමුවීම ඇති අවස්ථාවේදී පියයුරු ඇගයීමේ මධ්‍යස්ථාන වෙතින් ලබාගත හැක. එසේවුවද, බයොප්සි ප්‍රතිඵල ලබාගත හැක්කේ පැය 24 කට පසුව පමණි.

පිළිකා ඇති කාන්තාවන් සුළු සංඛ්‍යාවක් සඳහා කල් ඇතිව රෝගය හඳුනා ගැනීම මගින් සාර්ථක ලෙස ප්‍රතිකාර කිරීමේ අවස්ථා වැඩිවේ. වඩා විශාල පිළිකාවලට වඩා කුඩා පියයුරු පිළිකා සඳහා බොහෝ අවස්ථාවල වඩා අඩු සංකීර්ණ ශල්‍යකර්ම මගින් ප්‍රතිකාර කල හැකිය.

## මැමොග්‍රෑම් පරීක්ෂාව මගින් සියළුම පියයුරු පිළිකා පෙන්වයිද?

මැමොග්‍රෑම් පරීක්ෂණ මගින් 70-90% අතර පියයුරු පිළිකා සොයාගත හැකිය. කෙසේවුවද, පිළිකා කුඩා සංඛ්‍යාවක්, මැමොග්‍රෑම් පරීක්ෂණ මගින් දැකගත හැකි නොවේ. පියයුරු පිළිකා හේතුවෙන් සිදුව ඇති වෙනසක් මැමොග්‍රෆි පරීක්ෂාවෙන් සොයාගත නොහැකිවීම (සාවද්‍ය ඍණ) හෝ පියයුරු පිළිකා හේතුවෙන් නොවන වෙනසක් පරීක්ෂා කිරීමට (සාවද්‍ය ධන) වැඩිදුර පරීක්ෂණ පැවැත්වීමට ඉඩකඩ ඇත.

ඔබගේ අවසාන මැමොග්‍රෑම් පරීක්ෂණයේ කිසිදු පියයුරු පිළිකා ලක්ෂණ නැතිවුවද, ගැටිති, තණපුඩුවලින් ස්‍රාවය වීම, හෝ දිගින් දිගට පවතින පියයුරු වේදනාව වැනි වෙනස්කම් ඔබ පියයුරුවල දකිනම්, කරුණාකර ඔබගේ වෛද්‍යවරයාව හැකි විගස හමුවන්න. සිස්ට් වැනි හානිකර නොවන වෙනස්කම් ඔබගේ මැමොග්‍රෑම් පරීක්ෂාව මගින් බොහෝ අවස්ථාවල පෙනුනද, වැඩිදුර පරීක්ෂණ අවශ්‍යනම් පමණක් ඔබට ඒ බව දැනුම්දෙනු ඇත.

## මීළඟට කුමක් සිදුවේද?

ඔබගේ මීළඟ මැමොග්‍රෑම් පරීක්ෂාව කිරීමට කාලය පැමිණිවිට BreastScreen WA වෙතින් ඔබ හට ලිපියක් එවනු ඇත. කිසියම් හේතුවකින් ඔබට ලිපියක් ලැබුණේ නැතිනම්, දුරකථන අංක 13 20 50* ඔස්සේ අප අමතන්න, අප විසින් ඔබ සඳහා හමුවීමක් පිළියෙල කර දෙනු ඇත.

මෙම වැඩසටහන සම්බන්ධයෙන් ඔබගේ ලබාගත් මැමොග්‍රෑම් අනාගත පියයුරු පරීක්ෂණ සමග සසඳා බැලීම සඳහා ප්‍රවේශමෙන් තබනු ඇත.

වයස අවුරුදු 75 ට වැඩි කානතාවන් හට මතක් කිරීමේ ලිපි නොයවන අතර මාර්ගගතව හෝ දුරකථන අංක 13 20 50* ඔස්සේ දිනයක් වෙන්කර ගන්නා ලෙස අපි ඉල්ලා සිටිමු.

ඔබගේ ලිපිනය වෙනස්කලේ නම්, දුරකථන අංක 13 20 50* ඔස්සේ අප අමතා දැනුම් දෙන්න.

භාෂා පරිවර්තකයෙකු සඳහා කරුණාකර දුරකථන අංක 13 14 50 අමතන්න

(*ප්‍රාදේශීය දුරකථන ඇමතුම් ගාස්තුවට).

## මා විසින් වෙන කුමක් කල යුතුද?

**වයස අවුරුදු 50 සහ ඊට වැඩි කාන්තාවන් හට, සෑම වසර දෙකකට වරක්ම නොමිළේ මැමොග්‍රෑම් පරීක්ෂාවක් කරගත හැකිය.**

- ඔබ නිතිපතා පරීක්ෂාකර ගන්නේ නම්, කිසියම් පියයුරු පිළිකාවක් ඇතිනම්, මුල් අවස්ථාවල සොයා ගත හැකිවනු ඇත.
- පියයුරු පිළිකා සම්බන්ධ පවුල් ඉතිහාසය කොතරම් සැලකිය යුතුද යන්න මත, කාන්තාවන්ගෙන් 1-5% අතර ප්‍රමාණයක් වාර්ෂිකව මැමොග්‍රෑම් පරීක්ෂාව සිදුකර ගැනීම අවශ්‍ය විය හැකිය.
- ඔබට කලින් පියයුරු පිළිකා තිබුණිනම්, නිතිපතා ඔබගේ වෛද්‍යවරයා සමග පසු විපරම් හමුවීම් යොදා ගැනීම වැදගත් වන අතර වාර්ෂික මැමොග්‍රෑම් පරීක්ෂාවක් කරගත යුතුය.

**පියයුරු සම්බන්ධයෙන් අවබෝධයෙන් සිටින්න**

- ඔබගේ පියයුරු සම්බන්ධයෙන් සහ ඔබගේ පියයුරුවල සාමාන්‍ය තත්වය දැනගන්න. කණ්නාඩියෙන් ඔබගේ පියයුරු දෙස බලා, ඔබගේ පියයුරු වරින්වර අල්ලා බලන්න.
- ඔබගේ පියයුරුවල අසාමාන්‍ය වෙනසක් ඇතිනම්, හැකි විගස ඔබගේ වෛද්‍යවරයා හමුවන්න.
- ඔබ මීළඟ පරීක්ෂාවට ගියවිට ඔබගේ වෛද්‍යවරයාගෙන් පියයුරු සෞඛ්‍යයස ම්බන්ධයෙන් විමසන්න.

**නොසලකා හැරිය නොහැකි වෙනස්කම් අතර පහත දේ ඇත:**

1. ගැටයක්, හෝ පියයුරු හෝ කිහිල්ල ප්‍රදේශයේ ගැට සහිත හෝ ඝණවීමක්;
2. දිශාවේ වෙනසක්, යම් දෙයක් තණපිඩුවලින් ස්‍රාවයවීමක්, වණයක් හෝ කැසීමක් ඇතුළුව තණපුඩුවල වෙනස්කම්;
3. සමේ සිදුවන වල ගැසීමක්, රැළි ගැසීමක් හෝ රත් පැහැයක් වැනි ඕනෑම වෙනසක්;
4. පියයුරුවල අනික් ප්‍රදේශවලට වඩා වෙනසකට දැනෙන ප්‍රදේශයක්; හෝ
5. ඕනෑම අළුතින් දිගටම පවතින පියයුරුවල වේදනාවක්.

## ඔබට කිසියම් ගැටළුවක් තිබේද?

ඔබගේ වෛද්‍යවරයා සමග සම්බන්ධ වන්න, නැතිනම්: BreastScreen WA හමුවීම් සඳහා දුරකථන අංක 13 20 50 හෝ තොරතුරු සඳහා (08) 9323 6700 හෝ දුර බැහැර ප්‍රදේශවල කාන්තාවන් සඳහා නොමිළේ කථාකල හැකි දුරකථන අංක 1800 800 033 අමතන්න.

ඊමේල්: breastscreenwa@health.wa.gov.au

නැෂනල් රිලේ සේවාව (National Relay Service) www.relayservice.gov.au

පරිවර්තන සහ තෝල්ක සේවාව (Translating and Interpreting Service - TIS) 13 14 50

**ඔබගේ භාෂාවෙන් වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා වෙබ් අඩවිය වෙත පිවිසෙන්න:**

www.breastscreen.health.wa.gov.au/Breast-screening/Multicultural-women

BreastScreen AUSTRALIA
A joint Australian, State and Territory Government Program

BEAT BREAST CANCER
HAVE A FREE X-RAY
RING: 13 20 50

LIKE US ON facebook



**www.breastscreen.health.wa.gov.au**